**<u>බී.පී.අතුල පීරිස් එ. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව</u>**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම/45/2018 - 2018 අගෝස්තු මස 30 වන දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32 (1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්ය පටිපාටිය) රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්ය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මන්පිල

**කොමිෂන් සභා සාමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්.ජී.පුංචිහේවා

**කොමිෂන් සභා සාමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

**කොමිෂන් සභා සාමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ - ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක:** බී.පී.අතුල පීරිස් මහතා

**නොතීසි ලත් පාර්ශ්වය:** නම්කළ නිලධාරී, සභාපති, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

**පෙනී සිටීම:**

**අභියාචක** - බී.පී.අතුල පීරිස් මහතා

**පොදු අධිකාරිය** - එච්.එස්.සී.කුමාරි මිය - සහකාර අධ්‍යක්ෂ (නීති)

ටී.ඒ.හේම අජිත් මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොණු කරන ලද දිනය | 2017 සැප්තැම්බර් 16 |
| තොරතුරු නිළධාරියා තීරණය ලබා දුන් දිනය | 2017 සැප්තැම්බර් 28 |
| නම්කළ නිළධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2017 ඔක්තෝම්බර් 04 |
| නම්කළ නිළධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2017 නොවැම්බර් 10 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක 10.11.2018 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*1) 2010.02.01 දින සිට අභියාචක අනිවාර්ය නිවාඩු යැවූ පසු ඒ සඳහා අදාළ විනය පරීක්ෂණය 2010.07.07 දින සිට දෙවැනි වරටත් ආරම්භ කර ඇත. එම විනය පරීක්ෂණය අවසන් වූ පසු විනය පරීක්ෂණ නිලධාරී කේ.එම්.මලලසේකර මහතා විසින් සකස්කර ඇති වාර්තාවේ පිටපතක්.*

*2) එම පැමිණිල්ල මෙහෙය වූ කේ.කේ.පියසිරි මහතාගේ වාර්තාවේ පිටපතක්.*

*3) අභියාචක අනිවාර්ය නිවාඩු යැවීමට සාක්ෂියක් ලෙස පාදක කරගත් චන්ද්‍රන සෙනෙවිරත්න මහතාගේ දිවුරුම් ප්‍රකාශයේ පිටපතක්.*

*4) 2011.02.09 දින පැවති රූපවාහිනී අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමට සහභාගිවූවන්ගේ නාම ලේඛනයේ පිටපතක්.*

*5) 2011.02.09 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභියාචක සේවයෙන් පහ කිරීම සඳහා ලබා දුන් නියෝගයේ පිටපතක්.*

*6) 2009.10.12 දාතමින් චන්ද්‍රදාස පෙරේරා යන අය මට එරෙහිව එළවළු කොරටුවක් සම්බන්ධයෙන් රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයාට ඉදිරිපත් කරන ලද ලිපියේ පිටපතක්.*

තොරතුරු නිලධාරියා 2017 සැප්තැම්බර් 28 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ අභියාචක විසින් අංක 03 යටතේ ඉල්ලා සිටින තොරතුරු රූපවාහිනී සංස්ථාව සතු නොවන බැවින් එම තොරතුරු හැර ඉතිරි තොරතුරු ඉදිරිපත් කරන බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2017 ඔක්තෝම්බර් 04 දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරියා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් 2017 නොවැම්බර් 10 දිනැතිව අභියාචක කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සළකා බලන අවස්ථාවේදී උද්ගත වූ කාරණා:**

මෙහිදී අභියාචක විසින් ප්‍රකාශ කරන ලද්දේ 2017.09.16 වන දින ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ තොරතුරු නිලධාරියා වෙත කරන ලද තොරතුරු ඉල්ලීමට පිළිතුරු වශයෙන් තොරතුරු නිලධාරියා විසින් එවන ලද ලිපියේ, අභියාචක සිය තොරතුරු ඉල්ලීමේ අයදුම්පතෙහි අංක 03 යටතේ ඉල්ලා ඇති තොරතුරු තම ආයතනය සතුව නොමැති බවට කරන ලද ප්‍රකාශය සාවද්‍ය බවයි. එසේම, අභියාචක විසින් අංක 06 යටතේ ඉල්ලුම් කරන ලද තොරතුරු අභියාචක වෙත එවූ බවට තොරතුරු නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශය ද අසත්‍යයක් බව අභියාචක සඳහන් කරයි. කෙසේ වෙතත්, අංක 03 සහ 06 යටතේ ඉදිරිපත් කළ තොරතුරු හැර ඉතිරි තොරතුරු තමා වෙත ලැබුණු බව අභියාචක පිළිගනියි.

2018.02.22 වන දින පොදු අධිකාරිය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසම වෙත එවන ලද ලිපියක් මඟින් දක්වා ඇත්තේ අභියාචක විසින් ඉල්ලා සිටින ලේඛන, අභියාචකට එරෙහිව පැවති පරීක්ෂණයක් සඳහා රූපවාහිනී සංස්ථාවට පෞද්ගලිකව ලබා දෙන ලද ලේඛන වන බැවින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ වගන්ති අංක 5 (1) (අ) අනුව එම තොරතුරු ලබාදීම පොදු අධිකාරිය විසින් මුල් අවස්ථාවේදී ප්‍රතික්ෂේප කළ බවයි. නමුත්, එකී ප්‍රකාශයන් ලබා දුන් පුද්ගලයන්ගෙන්, එම තොරතුරු ලබා දීමට ඔවුන්ගේ අවසරය හිමිවනවා ද යන්න ඔවුන්ගෙන් ලිඛිතව විමසා ඔවුන් ඊට එකඟ වන්නේ නම් එම ලේඛන අභියාචක වෙත ලබා දීමට කටයුතු කරන බව ද පොදු අධිකාරිය විසින් තවදුරටත් එම ලිපියෙහි සඳහන් කර තිබුණි.

ඒ අනුව, 2018.07.16 සහ 2018.07.17 දිනැතිව පිළිවෙළින් චන්දන සෙනෙවිරත්න සහ චන්ද්‍රදාස පෙරේරා යන අය වෙත පොදු අධිකාරියේ නීති නිලධාරී විසින් යවන ලද ලිපි මඟින් උක්ත කී තොරතුරු ලබාගැනීම සම්බන්ධව ඔවුන් දෙපළගේ අනුමැතිය විමසා ඇති අතර, ඊට පිළිතුරු වශයෙන් චන්දන සෙනෙවිරත්න යන අය ඒ සම්බන්ධව සිය අකමැත්ත ප්‍රකාශ කර තිබුණි. එසේම, චන්ද්‍රදාස පෙරේරා යන අය එම කරුණ සම්බන්ධව කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා ඇති බව පොදු අධිකාරිය සඳහන් කර ඇත.

2018.08.30 දින පැවති අභියාචන වාරයේදී කරුණු ඉදිරිපත් කළ පොදු අධිකාරිය සඳහන් කර සිටියේ අංක 03 යටතේ වූ තොරතුරු ලබා දීමට එම දිවුරුම් පෙත්සම්කරු අකමැති වුවද, එම දිවුරුම් පෙත්සම් ලේඛනය අදාළ ලිපිගොනුවෙහි පවතින බවයි.

**නියෝගය:**

ඒ අනුව 2018.10.08 වන දින පැවැත්වෙන අභියාචන වාරයේදී එම ලිපිගොනුව කොමිසම වෙත ඉදිරිපත් කරන ලෙසට පොදු අධිකාරියට නියෝග කරන ලදී. එය කොමිසම විසින් විමසා බලා අවසන් නියෝගය නිකුත් කරනු ඇත.

අභියාචනය කල් තැබේ.

මීළඟ විභාග දිනය : 2018.10.08

---

මහින්ද ගම්මන්පිල - සභාපති

---

එස්.ජී.පුංචිහේවා - කොමිෂන් සභා සාමාජික

---

ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් - කොමිෂන් සභා සාමාජික

---

විනිසුරු රෝහිණී වල්ගම - කොමිෂන් සභා සාමාජික